ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
Presidential Secretariat



*Clean Sri Lanka' project to make Sri Lanka cleanest in Asian region*

# "Clean Sri Lanka"

**සමාජීය, පාරිසරික හා ආචාරධර්මීය පිබිදීමක් මඟින් සමාජය,වඩා දියුණු මට්ටමකට ඔසවා තැබීම සඳහා.....**

අංක 2415/59 හා 2024-12-19 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් 'Clean Sri Lanka' වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපිත කර ඇත.

සමාජීය සහ පාරිසරික වශයෙන් වඩාත් දියුණු තත්ත්වයකට සමාජය ඔසවා තැබීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් "Clean Sri Lanka" වැඩසටහන නියමිත කාල රාමුවක් තුළ සැලසුම් කිරීම, මඟ පෙන්වීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ සම්පූර්ණ කිරීම ජනාධිපති කාර්ය සාධක බලකායට පැවරී ඇත.

ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා සංවිධානාත්මක ව්‍යුහයක් නිර්මාණය කර 'Clean Sri Lanka' නියමිත කාලරාමුව තුළ අවසන් කිරීමට සැලසුම් කර ඇත.

"Clean Sri Lanka" අරමුණු සාක්ෂාත් කර ගැනීමට සංවර්ධන නිලධාරීයෙකු ලෙස ඔබගේ දායකත්වය මෙම ජාතික වැඩසටහන සාර්ථක කර ගැනීමට අප වෙත ලබා දිය හැකි ය.

## ඔබ,

බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි/ පදිංචි වීමට අදහස් කරන, පශ්චාත් උපාධිධාරී (නීතිය, ආර්ථික විද්‍යාව, සමාජයීය විද්‍යාව, කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව විෂය ක්ෂේත්‍ර) හා වයස අවුරුදු 40ට අඩු සංවර්ධන නිලධාරීයෙකු ලෙස දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නම්;

ඔබ සතු දැනුම, කුසලතා හා ආකල්ප කාර්යක්ෂමව, ඵලදායිතාවයෙන් හා අනලස්ව මෙම ජාතික වැයම සඳහා ලබා දීමට අවංකවම කැප වන්නේනම්;

ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්වලට සම්බන්ධ වී ලබා ගත් හැකියාවෙන් හා කණ්ඩායම් හැඟීමෙන් වැඩකිරීමට හැකි අයෙක් නම්;

'Clean Sri Lanka' ජාතික වැඩසටහන සමඟ එක් වීමට ඔබට හැකියාව ඇත.

**ඒ සඳහා ඔබගේ මූලික තොරතුරු පහත සැබැදිය මඟින් අප වෙත යොමු කරන්න.**

https://forms.gle/Ub4UB9tCTV7rHc2q6

**යොමු කළ ඉල්ලුම්පත් ප්‍රමාණය අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව මාර්ගගත ක්‍රමවේදය (Online) හරහා සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබේ.**


වැඩි විස්තර සඳහා අමතන්න ; +94 (0) 11 2 354 354 ( EX- 3468)

**Write email**
fea@presidentsoffice.lk

**Visit anytime**
Presidential Secretariat, Galle Face, Colombo 01, Sri Lanka.

**Contact us**
+94 (0) 11 2 340 340